RARE

# පුඤ්ඤ හා කුසල යන ශබ්දයන්ගේ පාරිභාෂික හා ව්‍යවහාරික අර්ථය පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්

RECEIVED
16 NOV 2016
Faculty of ... Studies
University of Kelaniya

එස්. ජේ. ඒ.එන්. කුමුදුනී
FGS/04/02/10/2007/02

දර්ශනපති බෞද්ධ දර්ශනය උපාධිය පූරණය කරනු පිණිස කැලණිය විශ්ව විද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය වෙත ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධයකි.

ප්‍රවේශ අංකය: 1287
වර්ග අංකය:

2014 ජනවාරි

# Abstract

The two terms Puñña and Kusala are used in early Buddhist discourses to explain individual's moral deeds. At the first glance one can say both are same because both terms represents good and virtuous actions. But there is remarkable deference between moral deeds which are reprinted by these two terms. Without understanding this difference many Buddhist followers are perform the their virtuous deeds.

Aim of this study is to point out the ethical conduct which should be done for the wellbeing of the continuation of samsāra as a Buddhist follower while pointing out the ethical way for the cassation of samsāra which is the ideal goal expected to be obtained by a Buddhist.

In early Buddhist discourses the world Puñña is often used in connection with mundane matters and lay life. To understand what puñña is it is necessary to accept the circle of samsāra and the belief in the law of Kamma. In this study it has been provide that the Puñña the meritorious deeds are nothing but the sensual happiness of a individual for this purpose a large number of references have been used.

In Buddhist teaching the term Kusala, (the wholesome deeds) is used in special sense. Very meaning of the word reveals the skillfulness faullessness, ability, mental health ect. Kusala or wholesome actions have the ability to remove mental impurities which are coming from the Lobha, dosa and moha the main three roots of evil thought. Therefore ethical deeds reprints by the term Kusala according to sources always connect with cassation or ending of samasara.


Key words – puñña, kusala, skillfulness, samsāra, mundane

# නිබන්ධ සාරාංශය

ආචාර විද්‍යාත්මක නිර්ණායකයක් වශයෙන් බෞද්ධ සදාචාර ධර්මය තුළ පුඤ්ඤ හා කුසල යන ව්‍යවහාරයන් චර්යාත්මක වශයෙන් ධනාත්මක ඇගයීමක් ඉදිරිපත් කරයි. ප්‍රාග් බෞද්ධ දාර්ශනික චින්තාව තුළ ද විවිධ ආචාරාත්මක ප්‍රස්තුතයන් ඔස්සේ සදාචාර සංකල්පයන් සාකච්ඡා කළ ද ඒවා බෞද්ධ පුඤ්ඤ හා කුසල යන සංකල්පයන් තුළ ප්‍රකට කෙරෙන යථාර්ථය නියෝජනය නොකරයි.

පුඤ්ඤ යන වචන ව්‍යවහාරයත්, කුසල යන වචන ව්‍යවහාරයත් නිවැරදි වූ අර්ථ භාවිතයක් යටතේ වර්තමාන ව්‍යවහාරික වාග් මාලාව තුළ යොදා ගෙන නොමැත. මෙම නිබන්ධය යටතේ මෙම වචනයන්හි මූලය, නිවැරදි අර්ථ භාවිතය, පිටකාගත ඉගැන්වීම් අධ්‍යයනය කරමින් ඉදිරිපත් කෙරේ.

පුඤ්ඤ සංකල්පයෙන් කර්ම ස්ථරය ද එයින් බලාපොරොත්තු වන අනාගත සැප විපාකයන් ද පංචකාම සම්පත්තිය ද නියෝජනය කරයි. කුසල සංකල්පයෙන්, මාර්ග ස්ථරයත් කුසල විපාක වශයෙන් ලබන රූපී අරූපී ධ්‍යාන හා සාන්දෘෂ්ටික වශයෙන් ලැබිය හැකි නිර්වාණ පාරප්‍රාප්තිය ද නියෝජනය කරයි. එබැවින් පුඤ්ඤ හා කුසල යන ශබ්දයන්ගේ වර්තමාන ව්‍යවහාරය මනා අවබෝධයකින් යුක්තව සකසා ගත යුතු අකාරය මෙම අධ්‍යයනය තුළින් හඳුනා ගනු ලැබ තිබේ.

ප්‍රමුඛ පද - පුඤ්ඤ කුසල, කර්ම ස්ථරය, මාර්ග ස්ථරය